# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2308/09 - 2022 නොවැම්බර් මස 29 වැනි අඟහරුවාදා - 2022.11.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍ර.ලේ.යොමු අංකය*: CHI/LND.1/AC/5/77
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය 4-3/11/2019 H/231

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන පනතින්) සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආනවිලුන්දන් පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 578 බී පිටිපන උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හලාවත (කොට්ඨාස අංක 8, මධ්‍යම පිටිපන හලාවත නගර සහා සීමාව තුළ) ගමේ පිහිටි පුත්තලම මිනුම් අධිකාරි විසින් පිළියෙළ කරන ලද අංක මූ.පි.පු.5559 හා 2022.10.27 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටස.

**01.** කැබලි අංක 01.
ඉඩමේ නම: පල්ලියවත්ත; විස්තරය: වත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක. (හලාවත, විජහ මාවත, අංක 15 හි පදිංචි ජේ.කේ. සුමේධ නිකලස් සඳරුවන් පෙරේරා භුක්ති විඳියි); ප්‍රමාණය: හෙක්ටයාර් 0.2925

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හා ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2023 පෙබරවාරි මස 27 වැනි දින පෙ.ව. 10.00 ට හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023 පෙබරවාරි මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

බී.ඩබ්.එම්.එම්.එස්. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,හලාවත.

2022 නොවැම්බර් මස 23 වැනි දින,
හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

EOG 11 - 0336

1A - G 038202 – 15 (2022/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*